# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## මහ කොළඹ ජලය සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3

## EIB සහ ADB ණය මගින් අරමුදල් සැපයේ

**කොළඹ මහා නගර සභාව සඳහා කිරුළ - නාරාහේන්පිට මළාපවහන පද්ධතිය සංවර්ධනය කිරීම**

**ICB කොන්ත්‍රාත් අංක : GCWWMIIP-P2/EIB/KN**

01. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන අරභයා යුරෝපා ආයෝජන බැංකුව වෙතින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය අරමුදලේ කොටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ යෝග්‍ය ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

02. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මින් ඉදිරියට "සේව්‍යයා" යනුවෙන් හැඳින්වෙන අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව, විෂය ක්ෂේත්‍රය පහත සැකෙවින් විස්තර කොට ඇති පරිදි කොටස් දෙකක් ලෙස සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් දන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

    විදුලි, යාන්ත්‍රික, SCADA යනාදිය ඇතුළු පොම්පාගාර දෙකක් ඉදිකිරීම සමග, කි.මී. 5.4 ක විවෘත කැපුම සහ කි.මී. 5.4 ක අගල් රහිත, ආසන්න වශයෙන් කි.මී. 10.8 ක ගුරුත්ව මලාපවහන ජාල පද්ධතිය අතුරා ඉදිකිරීම, මිමී. 315 බාහිර තව්වේ කි.මී. 1.6 ක HDPE බලය යෙදූ ප්‍රධාන වාහක නළය ඇතිරීම හා ඉදිකිරීම.

03. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය තනි අදියර කවර දෙක ක්‍රියා පටිපාටියට අනුකූලව මෙහෙයවනු ලබන අතර, සෑම රටකම සෑම ලංසුකරුවන්ටම විවෘතය.

04. "**කොළඹ - 7, ආනන්ද කුමාරස්වාමි මාවත, නො. 86, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේදී**" අභිලාෂී ලංසුකරුවන්ට ලංසුකරණ ලිපිලේඛන ලබා ගැනීමට පෙර කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලීමටත්, වෙනත් වැඩිමනත් විස්තර ලබා ගැනීමටත් පිළිවන. දුරකථනය (94)(11) 2665331, 5736015 හෝ 2665325, විද්‍යුත් තැපැල - pdgcwmp@sltnet.lk

05. ඉහත ලිපිනයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලං.රු. 100,000 ක් හෝ ඇ.ඩොලර් 500 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හෝ මහජන බැංකුවේ, නගර ශාලා ශාඛාවේ අංක 167-1001-8-9026033 දරන ගිණුමෙහි ලංසුවේ නම සඳහන් කර තැන්පත් කිරීමෙන් අනතුරුව ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. මුදල් ප්‍රේෂණය සනාථ කෙරෙන ෆැක්ස් පිටපතක් සමග ඉල්ලුම් කළවිට, ලංසුකරු විසින් තම රටේ ප්‍රවාහනය කලින් ඇණවුම් කර ඇත්නම් ලංසුකරණ ලිපිලේඛන කුරියර් සේවාව මගින් එවනු ලැබේ. එවන් අවස්ථාවකදී ගෙනැවිත් භාරදීම පිළිබඳව සේව්‍යයා වගකීමක් දරනු නොලැබේ.

06. ඉහත 4 වන ඡේදයේ දී ඇති ලිපිනයේදී 2021 මාර්තු 25 දින පෙ.ව. 9.00 ට ආරම්භව ස්ථානීය පරීක්ෂාවක් පැවැත්වෙනු ඇත. පූර්ව - ලංසු රැස්වීම එදිනම ප.ව. 2.30 ට, එම ස්ථානයේදී පැවැත්වෙනු ඇත. එම අවස්ථා දෙකටම සහභාගි වන ලෙස ලංසුකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

07. සියලුම තාක්ෂණික ලංසු සමග ලංසුකරණ ලිපිලේඛනයේ (2 වන කොටස - ලංසු දත්ත පත්‍රිකාව) විස්තර කොට දක්වා ඇති මුදලට ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

08 ලංසු දින 203 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, ලංසු සුරක්ෂණය ලංසු භාර ගැනීමේ අවසාන දිනයේ සිට දින 231 ක කාලයකට වලංගු විය යුතුය.

09. ලංසු ලිපිලේඛනවල සඳහන් විස්තර හා ආකෘතිය අනුව සකස් කරගත් ලංසු, "**ශ්‍රී ලංකාව, කොළඹ - 2, යූනියන් පෙදෙස, නො. 330, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (අවධානය / ප්‍රධාන ගණකාධිකාරී) සභාපති**" නමට යොමු කොට 2021 අප්‍රේල් 27 දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් "**ටෙන්ඩර් පෙට්ටියේ**" බහාලිය යුතුය.

10. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. තාක්ෂණික ලංසු, ඉහත සඳහන් ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට කැමැති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී විවෘත කෙරේ.

11. ලංසුකරුවන් විසින් ලංසු පිළියෙල කිරීම, පූර්ව - ලංසු රැස්වීමට සහභාගිවීම හා ලංසු භාරදීම සම්බන්ධයෙන් දරනු ලබන යම් පිරිවැය හෝ වියදම් සඳහා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය.**